No matter in which year you are in the university following a degree in food science, you have the privilege of joining the food industry with closer relations and walking toward your dream with us....

### *Be connected...*

IFSTSL is the largest network of Food Science professionals from academia and industry across the country who are committed to advancing the field of food science and technology. IFSTSL provides the opportunity for undergraduate students in the food science stream to build up a professional network and gain insight into the career paths that they can thrive for.

By the time you complete the degree program, you would be already in contact with the members of the IFSTSL and Sri Lanka Food Processors Association (SLFPA) through interactions in various activities which is helpful in building up your career. As student members, each one of you gets the opportunity to meet the researchers, personnel from the industry, academia and government bodies, as well as students and stay connected as a student member of the IFSTSL. Your admission to student membership would provide the opportunity to continue as a member paying only the membership fee.

### *Continuous learning...*

IFSTSL is the place for you to expand your practical knowledge and experience in the field of food science and technology, moving into territories of applied food science knowledge. Seminars and workshops are continuously organized by IFSTSL to deliver technical and general knowledge related to the many different aspects of the field. IFSTSL Newsletters provide you with an opportunity not only to gather knowledge but also to publish your writings while sharpening your written scientific communication skills and improving your visibility among the scientific community.

### *Stay updated...*

If you want to keep up with what's new in the food industry and line-up with local and global topics related to the field of food science, there are a few easy-peasy things you can do. Join our IFSTSL network, read the IFSTSL newsletter, be in touch with the IFSTSL Facebook page, YouTube channel and website... We help you stay updated...

### *Grow with us and shine....*

Grab the opportunities offered by IFSTSL. Symposiums, seminars, workshops, consultancy programs, articles, discussions and there are many more rewarding opportunities for you to participate and broaden your knowledge, identify real-world challenges, develop your leadership skills, and stay inspired.

# ඔබට මිලදී ගතහැකි පොත්




පාරිභෝගික නිරෝගීබව පිළිබඳ සැලකිලිමත්වීම ආහාර නිෂ්පාදනයේ, සැකසීමේ හා වෙළඳාමේ වගකීමකි. මෙම වගකීම සුරැකීමට ගොවිපොළෙහි සිට වෙළඳපොළ දක්වා ආහාර දාමයේ සෑම පියවරකදීම නිවැරදි ක්‍රම යොදා ගැනීම හා ආහාර ආරක්ෂිතතාවට මුල් තැනක් දීම වැදගත්ය.

ආහාර කර්මාන්තයක් ගොඩ නැගීමේ දී මෙන්ම පවත්වාගෙන යාමේ දී සපුරාලිය යුතු තාක්ෂණික හා නීතිමය අවශ්‍යතාවයන් මෙම පොතෙහි ඉදිරිපත් කර ඇත. ආහාර දාමයේ පියවර වන ගොවිතැන, ප්‍රාථමික ආහාර සැකසීම, ප්‍රවාහනය, ද්විතීයක ආහාර සැකසීම, ගබඩාකරණය, වෙළඳාම, ආහාර පිසීම හා පාරිභෝගිකයන් වෙත ඉදිරිපත් කිරීම එකිනෙකට සම්බන්ධ පුරුක් ලෙස සැලකේ. මේ සෑම පුරුකක් තුලදීම, ආහාර පරිභෝජනයට නුසුදුසු තත්ත්වයන් බිහි කරන භෞතික හා රසායනික ද්‍රව්‍ය එක්වීම, රසායනික වෙනස්වීම හෝ ක්ෂුද්‍ර ජීවීන් එක්වීම සිදුවිය හැකිය. ආහාර ආරක්ෂිතතාවය පිළිබඳ දුර්වල තාක්ෂණික දැනුම මෙම සිදුවීම් වලට බොහෝ දුරට හේතු වේ.

සෑම ආහාර හැසුරුම් ක්‍රියාවකදීම රෝග කාරක ද්‍රව්‍ය ආහාරයට එක්විය හැකි අවස්ථාවන් හා ක්‍රියාවන් පෙන්වා දීම තුළින් ආහාර නිෂ්පාදන හා සැකසුම් දාමය තුලදී සිදුවන හා සිදු නොවිය යුතු දෑ මෙන්ම පිළිපැදිය යුතු නිවැරදි තාක්ෂණික ක්‍රම එක් එක් පරිච්ඡේදයේ පෙන්වා ඇත. කර්මාන්තයක් ලෙස ආහාර නිෂ්පාදනය හා තම නිෂ්පාදන තරගකාරී ජාත්‍යන්තර වෙළඳපොලට ඉදිරිපත් කිරීමේ දී සපුරාලිය යුතු සහතික කිරීමේ ක්‍රියාවන් වෙත මඟ පෙන්වීම ද මෙම පොතෙන් සිදුවේ. තරගකාරී ජාත්‍යන්තර වෙළඳපොලට ආහාර සැපයීමේ දී එක් එක් රටවල ආහාර රෙගුලාසි හැදෑරීම අත්‍යවශ්‍යය. සම්මතයක් ලෙස කොඩෙක්ස් රෙගුලාසි පද්ධතිය අනුගමනය කිරීම වැදගත්ය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි දී මුහුණ පෑමට සිදුවන මූලික ගැටළු මෙහි විස්තර කර ඇත.

ආහාර කර්මාන්තයන්හි ආහාර පරීක්ෂීමේ හා සහතික කිරීමේ යෙදෙන්නන්ට තම දැනුම දියුණු කර ගැනීමට මෙම කෘතිය ඵලදායී වේ. මෙම කෘතිය ආහාර විද්‍යාව හා තාක්ෂණය ඉගැන්වීමේ යෙදෙන පාසැල් ගුරුවරුන් සඳහා සම්පත් දායක අත්පොතක් වන අතර, ආහාර සැකසුම් හා ආහාර ආරක්ෂිතතාවය සම්බන්ධ රැකියාවන්ට එක්වන්නන්ට දැනුම තියුණු කර ගැනීමට උපකාරී වේ.

# බිත්තර පෝෂණමය වටිනාකම හා ආහාර ආරක්ෂිතතාවය

සම්මානිත මහාචාර්ය උපාලි සමරජීව

බාල, මහළු සැමගේම දෛනික ආහාරයේ වැදගත් පෝෂණමය කොටසකි, බිත්තර. විවිධ ගති ලක්ෂණ වලින් අනූන බිත්තර, ආහාර කර්මාන්තයේදී පාරිභෝගික රුචිය ආකර්ෂණය කර ගැනීමටද යොදාගැනේ.

බටහිර පන්නයේ ආහාර අතර කේක් නිෂ්පාදනයේදීද, ශ්‍රී ලාංකික ආහාර අතර වටලප්පන් නිෂ්පාදනයේදීද, බිත්තර සංයුතියෙහි ගති ලක්ෂණ උපකාරී කරගනී. ඉල්ලුමට සරිලන පරිදි බිත්තර සැපයුම හීනවීම නිසා බිත්තර ආනයනයත් එමගින් සිදුවිය හැකි ආහාර ආරක්ෂිතතා (food safety) ප්‍රශ්න, අද සමාජ කතිකාවතක් වී ඇත.

## පෝෂණීය වැදගත්කම හා නිෂ්පාදනය

බිත්තර ආරක්ෂාකාරී පෝෂදායක ආහාරයකි. දිනකට බිත්තර තුනක් දක්වා පරිභෝජනය, සෞඛ්‍යයට අහිතකර නොවන බව විද්‍යාත්මකව තහවුරුකොට ඇත. සුදු මදය, කහ මදය හා ඝන පොත්ත බිත්තරයෙහි මූලික කොටස්ය. අධි පෝෂණීය ප්‍රෝටීන් සංයුතියක් ඇති බිත්තරයෙහි, විටමින් වර්ග වැඩි සංඛ්‍යාවක් පැවතීම වැදගත් ලක්ෂණයකි. විද්‍යාත්මක ක්‍රම මගින් බිත්තරයෙහි පෝෂණීය ලක්ෂණ වැඩි දියුණු කරගැනීම සඳහා ඔමෙගා-3 මේද අම්ල හා අයඩින් කිකිළියන් හරහා අන්තර්ගත කිරීම ජපානයේ සිදු කෙරේ.

කිකිළියන්ට දෙන ආහාර හා ඔවුන් වැඩෙන මෙන්ම රැකබලාගන්නා පරිසරය, බිත්තරවල තත්වය හා ආරක්ෂිතතාවය නිගමනය කෙරේ. මෙහිදී බිත්තරය සිරුර තුල වැඩෙන කාලයේදී මෙන්ම පිටතදී ඇති තත්වයන්, බිත්තරවල ආහාරමය ආරක්ෂිතතාවය නිගමනය කෙරේ. කාලගුණය, ආහාර, පානීය ජලය, අවට පරිසරයෙහි පිරිසිදුබව, කිකිළියන් හිරු එළියට විවෘතවීම හා ඔවුන්ගේ ශ්වසනය, බිත්තරයෙහි සංයුතිය කෙරෙහි ඍජුවම බලපායි. ගොවිපොලෙහි සිට කෑම මේසය දක්වා සිදුවන ක්‍රියාවන් නිසාද, බිත්තර ආහාරමය වශයෙන් නුසුදුසු විය හැකිය.

සාමාන්‍යයෙන් කිකිළි බිත්තරයක ප්‍රෝටීන් ග්‍රෑම් 6ක් පමණ හා මේද ග්‍රෑම් 6ක් පමණ ඇත. මෙවැනි පෝෂණීය මට්ටමක් බිත්තරයකින් ලබාගැනීම සඳහා කිකිළියන්ට දෙන ආහාර තුල ප්‍රෝටීන් 16-18%, කැල්සියම් 3.5%, සමග කාබොහයිඩ්රේට, විටමින් හා ඛනිජ ලවණ අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් තිබිය යුතුය. බිත්තරයක 50% පමණ ජලය අඩංගු වන බැවින් පිරිසිදු පානීය ජලය ඔවුනට නිරන්තරයෙන්ම සැපයිය යුතුය. බිත්තරයක ෆොස්ෆොරස්, සින්ක්, විටමින් A, B6, B12, D, ෆෝලික් අම්ලය හා තයමින් පෝෂ්‍ය පදාර්ථ අන්තර්ගත වේ. මෙම සංයෝග අතර සමතුලිතය හානි වීම නිසා බිත්තරවල පෝෂ්‍ය ගුණය මෙන්ම අනිකුත් ගති ලක්ෂණද වෙනස්වේ.

බිත්තරයක ස්වභාවික සංයුතිය, සත්ව ආහාර හා රසායන හරහා වෙනස්කල හැකිබව බිත්තර නිෂ්පාදකයෝ හොඳින් දනිති. වැඩි කලක් තබාගතහැකි මෙන්ම වඩාත් හොඳ පෙනුමක් දෙන බිත්තර නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයෝ විවිධ ආරක්ෂාකාරී රසායන, කිකිළි ආහාරයන්ට එක් කරති. බිත්තර කටුවෙහි ස්වභාවය දියුණු කිරීමට පාන් සෑදීමට ගන්නා සෝඩා (baking soda) හා ඇමෝනියම් ක්ලෝරයිඩ් එක් කෙරේ. කිකිළියන්ගේ පිපාසය වැඩි කිරීමට පොටෑසියම් ක්ලෝරයිඩ් ජලයට එක්කෙරේ. සමහර රටවල බිත්තර නිෂ්පාදනයේදී කිකිළි ආහාර හරහා ප්‍රතිජීවක ඖෂධ එක්කරන බව වාර්තාවේ. මෙය ආහාරමය වශයෙන් නුසුදුසු ක්‍රියාවකි.

ගම් බිත්තර සඳහා වැඩි පාරිභෝගික ඉල්ලුමක් සෑම රටකම පවතී. ස්වභාවික පරිසරයක වැඩෙන මනාව වාතාශ්‍රය හා ව්‍යායාමය ලබන කිකිළියන්, ආහාරය ලෙස පස ආශ්‍රිත කෘමීන්, ධාන්‍ය හා ගැඩිවිල්ලන් ගැනීමත්, බිත්තර කහ මදය වඩාත් වර්ණවත් වීමත්, පාරිභෝගික රුචිය ඇතිකිරීමට ඉවහල්වේ. කාර්මිකව බිත්තර නිෂ්පාදනය සමග අඩු වියදමකින් හා අඩු ඉඩ ප්‍රමාණයකින් වැඩි අදායමක් ලබාගැනීම සඳහා කිකිළියන් කූඩු තුල ජීවත් කරවීමට නිෂ්පාදකයන් හුරුවිය. මෙම ක්‍රමය තුලදී විද්‍යාත්මිකව නිෂ්පාදිත ආහාර හා ජලය පාලනය කිරීමත්, පැය 24 ක ආලෝකය දීමත් හරහා වැඩි බිත්තර නිෂ්පාදනයක් වෙත යොමුවේ.

## ආහාරමය ආරක්ෂිතතාවය හා ගුණාත්මක භාවය

බිත්තර ආහාරයක් ලෙස ආරක්ෂාකාරීබවෙන් තොරවන අවස්ථා ඇත. මේ පිළිබඳව බිත්තර නිෂ්පාදකයන්, කාර්මිකව බිත්තර යොදාගන්නන් හා පාරිභෝගිකයන් දැනුවත් විය යුතුය. නිෂ්පාදන ක්‍රියාවලියේදී, ප්‍රවාහනයේදී හා ගබඩාකිරීමේදී පිළිගත් විද්‍යාත්මක ක්‍රමයන්ගෙන් බැහැර වීම නිසා බිත්තර ආහාරමය වශයෙන් අනාරක්ෂිත වේ. බිත්තර තුලට රෝගකාරක ක්ෂුද්‍ර ජීවීන් ඇතුළුවීම හා අනවසරික රසායන එක්වීම මෙම හානියට මුල්වේ. බිත්තරය වැඩීමට අවශ්‍ය මූලික පෝෂ්‍ය පදාර්ථ කිකිළියන්ට නොලැබීම හා ඔවුන් ලෙඩ රෝග වලට භාජනය වීමද ආහාර ආරක්ෂිතතාවයට හා ගුණාත්මක භාවයට හානිකරය.

ඝනකම් සුදු මදය, පිරුණුබව පෙන්වන කහ මදය, හා ඝන බිත්තර කටුව හොඳ බිත්තරයක ලක්ෂණ වේ. කිකිළිය මනා සෞඛ්‍යයෙන් නොසිටින බව, සිහින් හා දුර්වර්ණ වූ බිත්තර කටු පෙන්නුම් කරයි. එවැනි බිත්තර තුල ඇති සුදු මදය පහසුවෙන් ගලායන අතර, කහ මදය දුර්වර්ණ වේ. හැඩය වෙනස්වූ බිත්තරයක් පෙන්නුම් කරන්නේ රෝගී කිකිළියකගෙන් ලැබූ ලක්ෂණය. එවැනි බිත්තර කටු මත කුඩු වැනි ස්වරූපයක් පෙන්නුම් කෙරේ. උෂ්ණාධික පරිසරයන්හි වැඩෙන කිකිළියන් ගේ බිත්තර කටුව සිහින්ය. කැල්සියම් කාබනේට් වලින් සැකසී ඇති බිත්තර කටුවෙහි වාතය ගමන් කල හැකි ඉතාමත් කුඩා වායු සිදුරු ඇත. මෙම වායු සිදුරු හරහා සුදු මදය හා කහ මදය තුළට බැක්ටීරියා හා වෛරස ඇතුළුවීම සිදුවිය හැකිය. එවැනි බිත්තර පහසුවෙන්ම ක්ෂුද්‍රජීවී දූෂණයට භාජනය වේ.

උෂ්ණත්වය අධිකවන විට, කිකිළියන් ආහාර ගැනීම අඩුවේ. මේ සමග සිදුවන ආහාරයෙන් ලැබෙන කැල්සියම් ප්‍රමාණය අඩුවීමත්, ෆොස්ෆොරස් හා කැල්සියම් අනුපාතය වෙනස් වීමත් නිසා බිත්තර කටුව වැඩීමේ දුර්වලතා ඇති වේ. මෙම අනුපාතය වෙනස්වීම සමගම බිත්තර මදයෙහි සින්ක් හා මැග්නීසියම් අනුපාතයන්ද වෙනස්වේ. මෙම වෙනස්වීම් බිත්තරවල පෝෂණීය වැදගත්කම හීන කෙරේ. බිත්තර නිෂ්පාදනයේදී කිකිළියන් කූඩු තුල සිරවී සිටීම නිසා වැඩි මේද ප්‍රමාණයක් සිරුරෙහි තැන්පත්වේ. එමගින් බිත්තරයෙහි මේද සංයුතිය මිනිස් ආහාරයක් ලෙස අහිතකර තත්වයට හැරේ. නල ජලයෙහි ඇති ක්ලෝරීන් බිත්තර කටුවෙහි ආරක්ෂක ලක්ෂණ හීන කෙරේ. එමෙන්ම කිකිළි ආහාරයේ අන්තර්ගතවන පෝෂණීය කොටස්, බිත්තරවල ගුණාත්මකබව කෙරෙහි ඍජු බලපෑම් ඇතිකෙරේ. විද්‍යාත්මකව සැකසුණු ආහාර වෙනුවට අඩු වියදමින් නිපදවෙන පෝෂණීය පදාර්ථ හීන ආහාර කිකිළියන්ට දීමෙන්, බිත්තරවල පෝෂණීය ලක්ෂණ හීන වේ.

ප්‍රතිජීවක ඖෂධ (antibotics) හා සතුන් වැඩීමේ වේගය ප්‍රවර්ණය කරන සංයෝග (growth promoters) ආහාරය මගින් වැඩෙන කිකිළියන්ගෙන් ලැබෙන බිත්තර හරහා ප්‍රතිජීවක ඖෂධයන්ට ඔරොත්තුදෙන බැක්ටීරියා මිනිස් සිරුරට එක්විය හැකිය. එය හානිකරය. බිත්තර තැම්බීමේදී හෝ පිසීමේදී බිත්තර තුල පවතින ප්‍රතිජීවක ඖෂධ හා සමහර හානිකර සංයෝග විටෙක නොනැසී පවතී. මිරිස්, ඉඟුරු වැනි ස්වභාවික ද්‍රව්‍ය කිකිළියන් ආහාර ගැනීම වැඩිකරන බව සොයාගෙන ඇත.

Next page→

ගොවිපොළෙහි සිට වෙළඳ දාමය හරහා බිත්තර පාරිභෝගිකයා වෙතට පැමිණවීමේදී, නොයෙකුත් ආපදාකාරී තත්වයන්ට යොමුවිය හැකිය. මේ අතරතුර 5% පමණ බිත්තර කටු පුපුරායාම සිදුවේ. එමගින් පිටවන සුදු හා කහ මද හරහා අනිකුත් බිත්තර කටු මත රෝගකාරක බැක්ටීරියා වැඩීමේ හැකියාව අධික වේ. පළුදුවූ හා අපිරිසිදු බිත්තර කටු හරහා බැක්ටීරියාවන් හා වෛරස පහසුවෙන්ම බිත්තර තුලට ඇතුළුවේ. මෙම සිදුවීම් වලකා ගැනීම සඳහා බිත්තර කටුව පිටතින් වියලි ලෙස පිරිසිදු කිරීම, ගබඩා කරණයේදී හා ප්‍රවාහනයේදී පවත්වාගත යුතු උෂ්ණත්ව හා සාපේක්ෂ ආර්ද්‍රතාවය පිළිබඳ උපදෙස් ඇත. බිත්තර ප්‍රවාහණය හා ගබඩාකිරීම සෙන්ටිග්‍රේඩ් අංශක 5-7 අතර උෂ්ණත්වය හා සාපේක්ෂ ආර්ද්‍රතාවය 70-75% අතර සීමා තුල පවත්වා ගත යුතුය. සති කිහිපයක ගබඩාකරණය හා ප්‍රවාහණයේදී බිත්තරයන්හි ජීවී ලක්ෂණ කෙමෙන් හීනවීමට පටන් ගනී. එමගින් ගුණාත්මක භාවය අඩුවේ. බිත්තර සති 3ක් දක්වා ශිතකරණයකද, හොඳට තැම්බිමෙන් පසු කටුව ඉවත් නොකොට සතියක්ද සෞඛ්‍යමය ලෙස ආරක්ෂාකාරීව තබාගත හැකිය. බිත්තර තුල පැවතිය හැකි හානිකාරක රසායනික හා ක්ෂුද්‍ර ජීවීන් එක්වූ අවස්ථාවන්, පසු විමසුමකදී සොයා ගැනීමේ පියවරක් ලෙස සියලුම බිත්තර බහාලුම් ලේබල වල නිෂ්පාදිත ගොවිපල සඳහන් කිරීම, දියුණු රටවල ක්‍රියාත්මක වන ආහාර ආරක්ෂිතතා පියවරකි. ජාත්‍යන්තර වෙළඳාමේදී බිත්තර ගොවිපොළ පවත්වා ගැනීම හා බිත්තර නිෂ්පාදනය කොඩෙක්ස් (Codex) ප්‍රමිතීන්ට අනුකූලව පවත්වා ගැනීම අත්‍යවශ්‍යය. බිත්තර ආනයනික ආයතන කොඩෙක්ස් ප්‍රමිතීන්ට පටහැනි බිත්තර හා නිෂ්පාදන මිළදී ගැනීමෙන් වැළකීම රාජ්‍යයන්හි අවශ්‍යතාවයකි.

බිත්තර කටුවේ ගති ලක්ෂණ, ඇතුළත මදය හා වායු කුහරය ආලෝක ධාරාවක් හරහා බැලීම මගින් බිත්තරයන්හි වෙළඳ වටිනාකම නිගමනය කෙරේ. මෙයට අමතරව, බිත්තර කුඩා (ග්‍රෑම් 28-36), මධ්‍යම (ග්‍රෑම් 36-44), විශාල (ග්‍රෑම් 45-54) හා අති විශාල (ග්‍රෑම් 55-65) ලෙසද  වර්ගීකරණය කෙරේ. බිත්තර AA, A හා B ලෙස ඇමරිකාව වර්ගීකරණය කෙරේ. මෙය බිත්තර ඇතුලත ලක්ෂණ පදනම් කොටගෙන කෙරේ.

සාමාන්‍යයෙන් 50%ක අවස්ථාවන්හිදී බිත්තර කටුව මත සැල්මොනෙල්ලා බැක්ටීරියාව ජීවත්වේ. බිත්තර ඇතුළතද සැල්මොනෙල්ලා බැක්ටීරියාව පැවතීම විරල වුවද, හැකියාවක් ඇත. රෝගකාරක ජීවියෙක් වන සැල්මොනෙල්ලා, බිත්තර හරහා ආහාරයට එක්වීම වලක්වා ගතයුතුය. වෙළඳපොළෙහි ඇති බිත්තර මත මළපහ හෝ රුධිර පල්ලම් පැවතීම, සැල්මොනෙල්ලා හා අනිකුත් රෝගකාරක බැක්ටීරියා පැවතීමේ ප්‍රභල ප්‍රවනතාවයක් පෙන්නුම කරයි. එවැනි බිත්තර වෙළඳාම නීතියට පටහැනිය. විවිධ රෝගයන්ගෙන් පෙලෙන කිකිළියන්ගෙන් ලබාගන්නා බිත්තර රෝග කාරක විය හැකිය. කුරුළුඋණ වයිරසය පවතින ප්‍රදේශයන්ගෙන් ලබාගන්නා කිකිළි බිත්තර භාවිතයට නීතියෙන් අවසර නොමැත. ශ්‍රී ලංකාව අවට රටවල සමහර පෙදෙස් මෙම වයිරසය පවතින ප්‍රදේශ ලෙස නම් කර ඇත. එවැනි පෙදෙස් වලින් බිත්තර ආනයනය කිරීම පාරිභෝගිකයන්ට මෙන්ම, ජාතික කුකුළු ගොවිපොළ කර්මාන්තයටද දැඩි ලෙස හානි කර විය හැකිය.

වසරකට බිත්තර බිලියන 47ක් නිපදවන ඉන්දියාව ප්‍රමාණාත්මකව ලොව ඉහළ බිත්තර නිෂ්පාදකයෙකි. ඉන්දියානු බිත්තර කර්මාන්තයේ පවතින තත්වයන් පිළිබඳ සමහර වාර්තාවන් පාරිභෝගික අරුචිය බිහිකෙරේ. සමහර ගොවිපල තුල මනාව ආහාර නොලැබූ රෝගී කිකිළියන්, තම මළපහ මත වාඩිවී සිටීමත්, අවට මකුණු දැල් පැවතීමත්, උකුණන් ගෙන් ගහන වීමත්, එකිනෙකා කොටාගැනීමත්, කාඩ්බෝඩ්, ප්‍රතිජීවක හා පලිබෝධනාශක සහිත ආහාර ගැනීමත් වාර්තා වී ඇත. මෙවැනි සිදුවීම් බිත්තරවල පෝෂණීය තත්වයට හානි කෙරේ. සෞඛ්‍යමය නොවන කුකුල් ගොවිපොළ පාලනයත්, තත්ව පාලන ක්‍රමවේදයන් නොමැතිවීමත්, බිත්තර මත හානිකර ක්ෂුද්‍ර ජීවීන් වැඩීමට උපකාරීවේ. මෙවැනි හේතුන් මත සමහර ඉන්දියානු ප්‍රදේශයන්හි නිපදවෙන බිත්තර, ජාත්‍යන්තර වෙළඳපොලෙහි ආකර්ෂණය දිනා ගැනීමට අපොහොසත්වී ඇති බව පෙනේ.

බිත්තර තුල තිබෙන විෂ සහිත බැර ලෝහ පිළිබඳ බොහෝ වාර්තා අනාරක්ෂිත මට්ටමේ බැරලෝහ නොපෙන්වයි. සාමාන්‍යයෙන් බිත්තර කටුවල බැරලෝහ ප්‍රමාණයන් සුදු හා කහ මදයට වඩා වැඩි නමුත්, ඒවා නීතිමය වශයෙන් අනුමත සීමාවන් තුල පවතී. බිත්තර තුල කැඩ්මියම් හා ඊයම් වැනි ලෝහ පැවතුන අවස්ථාවන්ද, ආහාර සඳහා නීතියෙන් තහනම් පලිබෝධනාශක ශේෂයන් ලෙස ඩී.ඩී.ටී. (DDT) හා හෙක්සක්ලෝරෝසයික්ලෝහෙක්සේන් (HCH) පැවතුන බවටද ඉන්දියානු විද්‍යාත්මක සඟරා අතීතයේදී පෙන්නුම් කර තිබිණ. විවිධ පළිබෝධනාශක ශේෂයන් බිත්තර වල පවතින බවට කෙන්යා, ජෝර්ඩානය වැනි රටවලින්ද වාර්තාවේ. එම පළිබෝධනාශක භාවිතය ලංකාව තහනම් කර ඇත. මිනිස් ආහාරයක් වන බිත්තර නිෂ්පාදනයේදී, ජාත්‍යන්තර සම්මතයන්ට පටහැනි වන පළිබෝධනාශක සහිත සත්ව ආහාරමය ද්‍රව්‍ය යොදාගැනීම නුසුදුසුය.

කුරුළුඋණ රෝගය ඇතිකරන වෛරසයන් බිත්තර හරහා පැතිරීම පිළිබඳ සැකයක් අප අතර පවතී. බිත්තර තම්බා ගැනීමේදී හෝ වෙනත් ආකාරයකින් පිසීමේදී වෛරස විනාශ වේ. බිත්තර ආහාරයට ගැනීම හරහා මිනිසුන්ට කුරුළුඋණ වැළඳුනු බවට කිසිම වාර්තාවක් මෙතෙක් නොමැත. කෙසේනමුත්, දැනට ලොව පිළිගත් ආරක්ෂක ක්‍රම තුල කුරුළුඋණ වාර්තා වූ ගොවිපොලක සිට කිලෝමීටර 10 අවටින් නිපදවෙන බිත්තර, එම වාර්තාගත සිද්ධියෙන් දින 30ක් ඇතුළත අපනයනය කිරීම නීතියට පටහැනිය. 2023 වර්ෂයේ මුල් භාගයේ සිටම දකුණු ඉන්දියාවේ සමහර පෙදෙස් වලින් වරින් වර කුරුළු උණ පිළිබඳ වාර්තා දකින්නට ලැබුණි. මෙම වසරේ මාර්තු 12 දින දකුණු ඉන්දියාවෙන් නැවතත් කුරුළුඋණ රෝගය වාර්තාවී ඇත. ආහාර සම්බන්ධව අවදානම් තත්වයන්ට පාරිභෝගිකයන් ගොදුරුවීම වලක්වා ගැනීම, නීති බලධාරීන්ගේ මෙන්ම අප හැමගේ වගකීමකි. කුකුළන් හරහා කුරුළුඋණ පැතිරීම වැළක්වීමේ පියවරක් ලෙස දහස් ගණනින් කුකුලන් විනාශ කරන බව මාර්තු 15 දින ඉන්දියාවෙන් වාර්තා විය.

ආහාරයක රෝගකාරක ක්ෂුද්‍රජීවී හා රසායන අහිතකර මට්ටමක නොපවතින බව නිගමනය කරන්නේ විද්‍යාත්මක කරුණු පදනම් කොටගත්, අවදානම අවම කිරීමේ සිද්ධාන්තයන් මතය. මෙහිදී කොතෙක් දුරට "අවදානම් විශ්ලේශන හා තීරණාත්මක පාලන ලක්ෂයන්" (HACCP - Hazard Analysis Critical Control Points) ක්‍රමවේදයට සම්බන්ධ සිද්ධාන්තයන් කුකුල් ආහාර නිෂ්පාදනයේදී හා බිත්තර ගබඩාකිරීමේදී මෙන්ම ප්‍රවාහණයේදී යොදා ගන්නේද යන්න, බිත්තර ආනයනයට අවසර දීමට පෙර සොයා බැලීම වැදගත්ය. දියුණු රටවල මුහුදු හා ගුවන් තොටුපොල හරහා ආහාර ඇතුළුවීමට පෙර දැඩි පරීක්ෂණ පසුබිම් කරගත් ප්‍රතික්ෂේප කිරීම්, රාජ්‍යයන් විසින් මනාව ඉටුකෙරේ. බොහෝ අවස්ථාවන්හිදී ශ්‍රී ලංකාවට අවේනික නොවන බැක්ටීරියා සහිත මස් වැනි ආහාර රට තුලට ඇතුළුවීම, ශ්‍රී ලංකා රාජ්‍ය යාන්ත්‍රණය විසින් ප්‍රතික්ෂේප කර ඇත. බිත්තර කටුව පිටතින් බොහෝවිට පැවතිය හැකි සැල්මොනෙල්ලා, එස්චරිචියා වැනි අධි රෝගකාරක බැක්ටීරියා වර්ග හා කුරුළුඋණ ඇතිකරන වෛරස, තාපය මගින් බිත්තර සැකසීමේදී විනාශවන බව පැහැදිලිය. සිද්ධස්ථාන වන්දනාවේ යන නඩ, තමනට නුහුරු ක්ෂුද්‍රජීවීන් ආහාර හරහා සිරුරට ඇතුළුවීම නිසා විදේශයන්හිදී රෝගකාරී වන බව, නොරහසකි. එවැනි ශ්‍රී ලාංකික පරිසරයට ආවේනික නොවන බැක්ටීරියාවන් හා කුරුළුඋණ බෝකරන වෛරසයන් රට ලංකාව තුලට ඇතුළුවීම වැලැක්වීම, ආරක්ෂාකාරී ජාතික අවශ්‍යතාවයකි.

# MEMBERS JOINED
## FROM JANUARY 2022 TO MARCH 2023

**Fellow members**
Prof. Anoma Chandrasekara - Wayamba University of Sri Lanka
Dr. Theja Herath - Industrial Technology Institute
Dr. Geethi Pamunuwa - Wayamba University of Sri Lanka
Dr. Wishwajith Kandegama - Wayamba University of Sri Lanka
Dr. Sumudu Warnakulasuriya - Industrial Technology Institute
Ms. S.A. Ayesha Roshini - Sri Lanka Standards Institute
Ms. Thilini Kananke - Sabaragamuwa University of Sri Lanka
Mr. Sudath Namal - Motha Confectionery Works (Pvt) Ltd.
Ms. Manula Fonseka - Jetwing Hotels Ltd.
Mr. Gihan Wijelath - Cinnamon Hotels & Resorts
Prof. Ananda Chandrasekara - Wayamba University of Sri Lanka
Dr. Niluni Wijesundera - Uva Wellassa University
Dr. Deshani Mudannayake - Uva Wellassa University

**Associate members**
Ms. Nuwandhi Piuymika - Country Style Food (Pvt) Ltd.
Ms. Isurika Thilini - Country Style Food (Pvt) Ltd.
Ms. Rumeshika Karunasiri - Country Style Food (Pvt) Ltd.
Ms. Oshadhi Perera - Country Style Food (Pvt) Ltd.
Ms. Ishadi Nayanathara - CMC Engineering Export GmbH
Ms. Vichakshi Sashenka - CMC Engineering Export GmbH

**Student members**
Ms. J.H. Sachini Madumali – Sabaragamuwa University of Sri Lanka
Ms. Lanka Bashini Kodithuwakku - Sabaragamuwa University of Sri Lanka
Ms. Narmada De silva - Sabaragamuwa University of Sri Lanka

# Incorporation of the Institute of Food Science and Technology of Sri Lanka by an Act of the Parliament

Currently, IFSTSL operates as a registered body under the Board of Investment along with other private sector entities. IFSTSL is looking forward to get strengthened through official State recognition by incorporation through an Act of the Parliament. The Act is drafted and reviewed by the State authorities with cabinet approval. We are in the process of getting it through the Parliament.

A meeting was held to brief the Honourable Minister of Agriculture, Mr. Mahinda Amaraweera, regarding the incorporation of the Institute of Food Science and Technology of Sri Lanka (IFSTSL) on 15th March 2023 at the Ministry of Agriculture. The Minister was impressed by the objectives and the achievements of the IFSTSL and directed officials of the Ministry to take action to incorporate the IFSTSL obtaining necessary approvals. Soon after obtaining the approval of the Cabinet of Ministers, the act for the incorporation of IFSTSL will be submitted to the parliament.

Emeritus Prof. Upali Samarajeewa, Prof. Niranjala Perera, Dr. Sumudu Warnakulasuriya, Mr. Dhammika Gunasekara and Mr. Rohantha De Fonseka participated at this meeting on behalf of the IFSTSL. The IFSTSL appreciates the great service of Mr. Wasantha Jayawardena.

# Opportunity for you to join as a member of IFSTSL....

Persons interested in becoming members of the IFSTSL are requested to obtain the application form from the office or download it from the official website.

IFSTSL membership is open to all those who are engaged in the food industry. The following membership categories are available for individual applicants and corporate bodies.

a) Fellow members
b) Associate members
c) Student members
d) Corporate members
e) Associate corporate members
f) Interim members

The admission fee is Rs.1000/= for individual members and Rs.5000/= for Corporate members. Annual subscription is Rs.2500/= for Fellows and Associate members; Rs.15,000/= for Corporate members; Rs.10,000/= for Associate Corporate members. For interim members, the admission fee is Rs.1000/= for individuals and Rs.5000/= for corporate members. Annual subscription for interim membership is Rs.2000/= for individuals and Rs.5000/=. For student members, no annual subscription is charged, and the admission fee is Rs.1000/=, which is valid till they complete the degree and become a full member paying annual subscription.

Duly completed applications should be submitted to the IFSTSL office with hard copies of required documents to the Institute of Food Science and Technology Sri Lanka (IFSTSL), No.21D, Vijaya Kumaratunga Mw (Polhengoda Gardens), Colombo-05. Postal submissions could be done only through registered post with a cheque or a bank paying slip for the total admission fee and membership fee.

**For membership fee payments:**
A cheque may be drawn in favour of "Institute of Food Science & Technology Sri Lanka", and cross A/P only or deposit money into the following bank account and send the bank paying slip through registered post with the membership application form.
Bank: National Development Bank (NDB), Havelock Town (Jawatta)
Account Number: 101-000151786

**For any clarification, please contact:**
**Mrs. Sandhya Fernando**
**Phone: 011-7548770 or 011-4920206; Fax: 011-7548771**
**Email: info@ifstsl.org**

**For additional information about IFSTSL, please visit www.ifstsl@org**

# Publications, Contributions and Achievements by IFSTSL Members
## (From January 2022 to March 2023)

**Dr. H. M. Theja Herath – Industrial Technology Institute**

***Paper publications***

Pushpakumara A.G.S.K., Madage S.S.K., Gunasekara N., Samaranayake M.D.W. and Herath H.M.T. (2022). Designing of Ready to Eat Convenient Mid - Day Meal for Children (5- 10 yrs) and Adolescents (11-19 yrs) of Sri Lanka Based on Nutritional Perspective. European Journal of Nutrition & Food Safety 14 (7): 1-12.

Ranaweera N.I., Pitipanarachchi R.C., Herath H.M.T. and Chandramali D.V.P. (2022). Development of vacuum-dried powder and drinking yoghurt from Soursop fruit (*Annona muricata* L.) and evaluation of their physico-chemical and functional properties. Journal of National Science Foundation Sri Lanka 50 (2): 489 – 502.

Idangodage I.P.A., De Siva A.B.C.G.J., Herath H.M.T. and Jayasinghe J.M.J.K. (2023). Development and Physico-Chemical Evaluation of an "Isotonic Nas Narang (*Citrus madurensis*) Sports Drink. Journal of Advances in Food Science & Technology 10 (2): 75-85.

***Communications***

Wickramarachchi L.A., Herath H.M.T., Rajawardene D.U. and Jayasinghe M. (2022). Development of a grain-milk functional beverage and evaluation of physico-chemical and sensory properties. Proceedings of Vingnanam Research Conference (VRC), Track C: Biological, Food Science and Technology, Jaffna University International Research Conference-2022, Sri Lanka, pp 41.

Wickramarachchi L.A., Herath H.M.T., Rajawardene D.U. and Jayasinghe M. (2022). Development of a milk-grain food supplement and determination of physico-chemical properties. Proceedings of Vingnanam Research Conference (VRC). Track C: Biological, Food Science and Technology, Jaffna University International Research Conference-2022, Sri Lanka, pp 44.

Grero K.M.U., Pathirage P.M.T.D. and Herath H.M.T. (2022). Nutritional information and healthiness of ready-to-eat/cook packaged food products available for children in Sri Lanka and attitudes of parents living in western province toward purchasing. Proceedings of the International Conference on Applied and Pure Sciences -2022. University of Kelaniya. pp. 91.

Wickramarachchi L.A., Herath H.M.T., Rajawardene D.U. and Jayasinghe M. (2022). Development of a grain-milk pasteurized functional beverage and evaluation of physico-chemical and microbial properties. Proceedings of 78$^{th}$ Annual Session of Sri Lanka Asso. Advnt of Sci, pp 108.

Pushpakumara A.G.S.K., Wickramarachchi L.A., Herath H.M.T. (2023). Development and Nutritional Analysis of Purple Yam (Dioscorea alata L.) Flour Based Healthy Pudding Mix. Proceeding of Annual Scientific Sessions of Nutrition Society of Sri Lanka (NSSL). Pp 55.

Hansika, G.D.R., Perera, O.D.A.N., Herath, H.M.T. Formulation of multi-grain nutribar enriched with Purple yam (Dioscorea alata var. purpurea) for undernourished population. Undergraduate Research Symposium-2022, Faculty of Livestock Fisheries & Nutrition. University of Wayamba (In press).

**Dr. W.A.Harindra Champa – Wayamba University of Sri Lanka**

***Publications***

Books Lime (Citrus aurantifolia) – A Technical Guide for Production, Processing and Value Addition (2022). W.A. Harindra Champa (Ed). National Institute of Postharvest Management, Jayanthi Mawatha, Anuradhapura, Sri Lanka. ISBN: 978-624-6236-00-7 (Available in Sinhala and Tamil medium).

***Full-text research articles in proceedings***

Kithmini, N.K.S., Champa, W.A.H, De Silva, M.S.W., and Wijewardana, R.M.N.A. (2022). A coating formula developed from Neolitsea cassia leaf extract extends storage life of lime (*Citrus aurantifolia*) fruit, Acta Hortic. 1336. ISHS 2022. doi 10.17660/ActaHortic.2022.1336.24. pp. 181-188.

Herath, H.M.N.S., Champa, W.A.H., Perera, O.D.A.N., and Wijesekara, R.G.S. (2022) Herbal-based ripening stimulant accelerated the ripening of banana (*Musa acuminata* 'Embul') Acta Hortic. 1336. ISHS 2022. doi 10.17660/ActaHortic. 2022.1336.10. pp. 67-74.

***Achievements***

Champa, W.A.H - Best researcher award in the session on Food and Nutrition at the Wayamba University Research Congress held on 9$^{th}$ December, 2022.

***Consultancies***

Appointed as the Expert consultant and resource person in the FAO funded project on "Support R and D activities for innovative local food production and enhancing food testing facility-378/22/TCP/SRL/3804

**Dr. Sumudu Warnakulasuriya**

Yalegama, C., Warnakulasuriya, S.N., and Wanasundara J.P.D. 2023. Coconut; A sustainable source for plant protein with several co-products. In Sustainable Protein Sources. Second Edition. Eds. S. Nadathur, J.P.D. Wanasundara, L. Scanlin. Elsevier (In Print).

**Ms. Chasna Rasmi**

Chasna, M.R.P., Jayathilake, C., and Gunawardhana, K.V.T. Applying ultrasonication as a non-thermal modification to alter the physicochemical characteristics of tapioca starch. Proceedings of the International Conference on Innovation and Emerging Technologies, November 25-26, 2022, Faculty of Technology, University of Sri Jayewardenepura.

**Prof. Upali Samarajeewa - Professor Emeritus, University of Peradeniya**

***Publications and communications***

Samarajeewa, U. (2022). Heavy metals and food safety in Sri Lanka – A review. Journal of the National Science Foundation of Sri Lanka. 50; (3) 511-562.

Samarajeewa, U. (2022). Safer foods – better health. Vidurawa (Science Magazine of the National Science Foundation) 39; 3-8.

Samarajeewa, U. (2022). Aflatoxins and food safety in Sri Lanka. Vidurawa (Science Magazine of the National Science Foundation) 39; 13 - 17.

Samarajeewa, U. (2022). Pesticide residues and food safety in Sri Lanka. Vidurawa (Science Magazine of the National Science Foundation), 39; 23 - 26.

Samarajeewa, U. (2022). Veterinary drug residues and food safety in Sri Lanka. Vidurawa (Science Magazine of the National Science Foundation) 39; 35 - 38.

Samarajeewa, U. (2022). National Food Control System: Food safety and quality assurance in Sri Lanka. Invited presentation to the Nutrition Society of Sri Lanka at the Annual Scientific Sessions held in Sri Lanka (23 January 2022).

Samarajeewa, U. (2022). The Researcher and the Future. (Letters to the Editor) Current Scientia, 25(2); 4–5.

Samarajeewa, U. (2023). Polycyclic aromatic hydrocarbons and food safety – A review. Journal of the National Science Foundation of Sri Lanka. 51; (accepted for publication in June 2023).

***Others***

Served in the Organizing Committee of the "World Congress on Food Technology, Nutrition and Applied Microbiology" held on 18th August 2022 in Paris.

Served as 'Laboratory Expert for Laboratory Rationalization Strategy' in the project "Enabling Market Access to Agricultural Products through Improved Good Safety System in Tajikistan" funded by the International Trade Centre of the UN system. (January – February 2022).

Continued to serve as 'Consultant on laboratory development for accreditation in Bangladesh' in the project on 'Feed the Future Bangladesh: Improving Trade and Business Enabling Environmental Activity' funded by 'Economic Integration Forum Inc. of USA' in January 2022.

***Training programs & seminars***

Samarajeewa, U. (2022). Current technical problems with food exports. Seminar on Meeting the Export Oriented Standards in the Food Value Chain. Conducted by IFSTSL. (21st January 2022)

Samarajeewa, U. (2022). Full validation and partial validation (Method validation and verification) for diagnostic test methods. Azerbaijan Food Safety Authority, Baku, Azerbaijan. (25 January 2022).

Samarajeewa, U. (2022). Estimating uncertainty of measurement. Azerbaijan Food Safety Authority, Baku, Azerbaijan. (14 February 2022).

Samarajeewa, U. (2022). අමුද්‍රව්‍යයන්හි ඇෆ්ලටොක්සින් පැවතීම. Program for the Ceylon Biscuits Ltd. by IFSTSL. (14 March 2022)

Samarajeewa, U. (2022). Food safety and nutrition concerning food security. Seminar on 'Safer Food for Better Health' organized by IFSTSL on the Food Safety Day (7 June 2022).

Samarajeewa, U. (2022). පොල්තෙල් නිෂ්පාදන ක්‍රියාවලියේ දී වඩාත් සැලකිලිමත් විය යුතු අවස්ථා හා දේශීය පොල්තෙල් නිෂ්පාදන ක්‍රියාවලිය රැකගැනීමට ගත යුතු පියවර. To the coconut industries registered under the Coconut Development Authority by IFSTSL. (16 June 2022).

**Contributions**

Donated 60 copies of the book titled ආහාර ආරක්ෂිතතාවය to libraries of 60 schools to be used in teaching food science & technology by teachers.

(Same book was printed by the Ministry of Health to be used by the Food Inspectors and Public Health Inspectors)